# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය
மாகாண பொதுச்சேவை ஆணைக்குழு, கிழக்கு மாகாணம், திருகோணமலை
PROVINCIAL PUBLIC SERVICE COMMISSION, EASTERN PROVINCE, TRINCOMALEE


ඔබේ අංකය / உமது இல / Your No

මගේ අංකය / எனது இல / My No — EP/07/03/02/20-15/2026

2026.01.09

ප්‍රධාන ලේකම්
ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
පළාත් අධ්‍යක්ෂවරුන්/කොමසාරිස්වරුන්/මහ නගර සභා කොමසාරිස්වරුන්
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්/නගර සභා ලේකම්වරුන්
ප්‍රාදේශීය සභා ලේකම්වරුන්,
නැගෙනහිර පළාත.

**නැගෙනහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026**

නැගෙනහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2026 අප්‍රේල් මස පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ **"Our Services"** යටතේ ඇති **"Online Applications-Recruitment Exams/E.B. Exams"** ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ **මාර්ගගත** ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජනවාරි මස 12 වැනි දින පෙ.ව.9.00ට විවෘත වන අතර 2026 පෙබරවාරි මස 09 වැනි දින ප.ව. 9.00ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඒ අනුව ඔබ ආයතනයට අනුයුක්තව ඇති සියලුම ආයතනවල අදාළ නිලධරයන්ගේ දැනගැනීම සඳහා මෙය යොමු කළ යුතු වේ.

පළමු වරට අයදුම් කරන අවස්ථාවේදී විභාග ගාස්තු අයකරනු නොලැබේ. ඉන්පසු වාරවලදී විභාග ගාස්තුව එක් විෂයයක් සඳහා රු. 250කි. විභාග ගාස්තු ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් විභාග නිවේදනයේ හා වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

**මේ සඳහා වන විභාග නිවේදනය පහත දැක්වෙන නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමට හැකිය. විභාග නිවේදනය හොඳින් කියවා අවබෝධ කොට ඉන්පසුව අයදුම් කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.**

**www.ep.gov.lk → Exams → E.B. Exam**

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.


**தொலை பேசி / දුරකතන / Telephone**

அலுவலகம் / කාර්යාලය / Office : 026 2220092
தொலைநகரி / ෆැක්ස් / Fax : 026 2222174
மின்அஞ்சல் / විද්‍යුත් තැපෑල / E-mail : ppscep@gmail.com

கன்னியா வீதி, வரோதயநகர், திருகோணமலை
කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය
Kanniya Road, Varothayanagar, Trincomalee